# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2480/22 - 2026 මාර්තු මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2026.03.19**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.-බී. 24/1951 (xiv).

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වන වගන්තිය සමඟ කියවිය යුතු 141 වන, 143 වන, 144 වන, 157අ වන, 168 වන සහ 190 වන වගන්ති යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**බිමල් නිරෝෂන් රත්නායක,**
ප්‍රවාහන, මහාමාර්ග සහ
නාගරික සංවර්ධන අමාත්‍ය.

2026 මාර්තු මස 19 වැනි දින
කොළඹ දී ය.

**නියෝග**

2018 ජනවාරි මස 15 වන දින අංක 2054/8 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ සහ 2025 සැප්තැම්බර් මස 25 වන දින අංක 2455/29 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද නියෝග මගින් සංශෝධිත 2011 අගෝස්තු මස 03 වැනි දින අංක 1717/14 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද 2011 අංක 2 දරන මෝටර් වාහන (අධිවේගී මහා මාර්ග) නියෝග, එහි 8 ඇ වන නියෝගයට ඉක්බිතිව ම පහත දැක්වෙන නියෝගය ඇතුළත් කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

"8ඇඅ. 8ඇ වන නියෝගයේ (1) වන උපනියෝගයේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, පහත සඳහන් මෝටර් වාහන පන්ති සම්බන්ධයෙන් 8අ, 8ආ සහ 8ඇ වන නියෝගවල විධිවිධාන, 2026 මාර්තු මස 20 දින දිනයෙන් ආරම්භ වන සහ 2026 ජුනි මස 19 වන දිනයෙන් අවසාන වන කාලසීමාව තුළ අදාළ වීම නතර වන්නේ ය:-

(අ) 8අ, 8ආ සහ 8ඇ වන නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන විට නිෂ්පාදකයා විසින් පසුපස මැද ආසනය සඳහා 8ඉ වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි පුද්ගල ආරක්ෂක ආසන පටියක් සවිකර නොමැති මෝටර් රථයක් අධිවේගී මහාමාර්ගයක ධාවනය කරනු ලබන හෝ භාවිත කරනු ලබන හෝ අධිවේගී මහාමාර්ගයකට ඇතුළත් කරනු ලබන එම මෝටර් රථයේ රියදුරු හෝ අයිතිකරු;



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) 8අ, 8ආ සහ 8ඇ වන නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන විට නිෂ්පාදකයා විසින් පසුපස මැද ආසනය සඳහා හෝ පසුපස විවිධ ආසන සඳහා 8ඉ වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි පුද්ගල ආරක්ෂක ආසන පටි සවිකර නොමැති සැහැල්ලු මෝටර් කෝච් රථයක්, මෝටර් කෝචයක්, බර මෝටර් කෝච් රථයක්, ද්විත්ව කාර්ය වාහනයක්, සැහැල්ලු මෝටර් ලොරියක්, බර මෝටර් ලොරියක් හෝ මෝටර් නිවසක් අධිවේගී මහාමාර්ගයක ධාවනය කරනු ලබන හෝ භාවිත කරනු ලබන හෝ අධිවේගී මහාමාර්ගයකට ඇතුළත් කරනු ලබන එම සැහැල්ලු මෝටර් කෝච් රථයේ, මෝටර් කෝචයේ, බර මෝටර් කෝච් රථයේ, ද්විත්ව කාර්ය වාහනයේ, සැහැල්ලු මෝටර් ලොරියේ, බර මෝටර් ලොරියේ හෝ මෝටර් නිවසේ රියදුරු හෝ අයිතිකරු;

(ඇ) 8අ, 8ආ සහ 8ඇ වන නියෝග ක්‍රියාත්මක වීම ආරම්භ වන විට නිෂ්පාදකයා විසින් පසුපස මැද ආසනය සඳහා හෝ පසුපස විවිධ ආසන 8ඉ වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි පුද්ගල ආරක්ෂක ආසන පටි සවිකර නොමැති දෛනික කාර්යාල ප්‍රවාහන සේවයේ හෝ පාසල් ප්‍රවාහන සේවයේ නියුතු ද්විත්ව කාර්ය වාහනයක්, සැහැල්ලු මෝටර් කෝච් රථයක්, මෝටර් කෝචයක් හෝ බර මෝටර් කෝච් රථයක්, අධිවේගී මහාමාර්ගයක ධාවනය කරන හෝ භාවිත කරන හෝ අධිවේගී මහාමාර්ගයකට ඇතුළත් කරන එකී ද්විත්ව කාර්ය වාහනයේ, සැහැල්ලු මෝටර් කෝච් රථයේ, මෝටර් කෝචයේ හෝ බර මෝටර් කෝචයේ රියදුරු හෝ අයිතිකරු.”

EOG 03 - 0163